# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1634/32 - 2010 ජනවාරි 01 වැනි සිකුරාදා - 2010.01.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී )

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනත (235 වැනි අධිකාරය)

**10 (අ) වැනි වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය ) වන රේගු ආඥාපනතේ 10 (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, 2008 නොවැම්බර් මස 06 වැනි දිනැති අංක 1574/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ සම්බන්ධයෙන් හැර අන් සියලු ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් දැනටමත් ක්‍රියාත්මක වරණීය හා සාමාන්‍ය තීරු බද්ද මත පනවා ඇති සියයට පහළොවක (15%)ක අධිභාරය, ක්‍රියාත්මක කිරීම, 2010 ජනවාරි මස 01 වැනි දින සිට 2010 ජුනි මස 30 වැනි දින දක්වා තවත් මාස හයකට (06) මෙම නියෝගය මගින් දීර්ඝ කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍ය).

2009 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

235 වන අධිකාරය වූ රේගු ආඥාපනතේ 10 (අ) වගන්තිය යටතේ වූ උක්ත නියෝගය, එකී ආඥාපනතේ "අ" උපලේඛනය වූ තීරුගාස්තු නාමාවලියේ පහත දැක්වෙන පරිච්ඡේද, ශීර්ෂ හා උප ශීර්ෂයනට ගැනෙන භාණ්ඩ සම්බන්ධයෙන් බල නොපැවැත්වේ.

1A - G 12297— 930 (2010/01)

(1) පහත ශීර්ෂ හා උප ශීර්ෂයනට ගැනෙන, කිරි සහ යොදය

| | | |
|---|---|---|
| 04.02 | | කිරි සහ යොදය සිනි හෝ වෙනත් රස කාරක අඩංගු වූ හෝ සාන්ද්‍ර කළ |
| 0402.10 | - | පිටිමය, කැට වශයෙන් හෝ වෙනත් ඝන ස්වරූපයෙන්, මේදයෙහි අඩංගු ප්‍රමාණය මුළු බරින් 1.5% නොඉක්මවන |
| | - | පිටිමය, කැට වශයෙන් හෝ වෙනත් ඝන ස්වරූපයෙන්, මේද අඩංගු ප්‍රමාණය මුළු බරින් 1.5% ඉක්මවන : |
| 0402.21 | -- | සීනි හෝ වෙනත් රස කාරක අඩංගු නොවූ |
| 0402.29 | -- | අනෙකුත් |
| | - | අනෙකුත් : |
| 0402.91 | -- | සීනි හෝ වෙනත් රස කාරක අඩංගු නැති |
| 0402.99 | - | අනෙකුත් : |
| 0402.99.90 | ---- | අනෙකුත් |

(2) උප ශීර්ෂ 0701.90 යටතට ගැනෙන, අර්තාපල්

(3) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන, ළූණු සහ ෂැලොට්

| | | |
|---|---|---|
| 0703.10 | - | ළූණු සහ ෂැලොට් |
| 0703.10.10 | ---- | රතු ළූණු |
| 0703.10.20 | ---- | බී ළූණු |
| 0703.10.30 | ---- | අනෙකුත් ළූණු |
| 0703.10.90 | ---- | අනෙකුත් |

(4) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන, පියළි රනිල එළවළු

| | | |
|---|---|---|
| 0713.40 | - | පරිප්පු (ලෙන්ටිල්ස් ) |
| | -- | මයිසූර් පරිප්පු (රතු පරිප්පු ) සම්පූර්ණ හෝ පියලි කළ |
| 0713.40.11 | ---- | සම්පූර්ණ |
| 0713.40.12 | ---- | පියළි කළ |
| | | කහ පරිප්පු සම්පූර්ණ හෝ පියළි කළ |
| 0713.40.21 | ---- | සම්පූර්ණ |
| 0713.40.22 | ---- | පියළි කළ |

(5) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන, මිරිස්

| | | |
|---|---|---|
| 0904.20 | - | වියලූ හෝ කුඩු කළ හෝ ඇඹරූ " කැප්සිකම් " ගණයේ හෝ පිමෙන්ටා ගණයේ පළතුරු : |
| 0904.20.11 | ---- | කුඩු නොකළ හෝ නොඇඹරූ |
| 0904.20.12 | ---- | කුඩු කළ හෝ ඇඹරූ |

(6) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන බීජ

| | | |
|---|---|---|
| 0909.20 | ---- | කොත්තමල්ලි බීජ |
| 0909.30 | ---- | සූදුරු බීජ |
| 0909.50 | ---- | රට ඇදුරු බීජ, ජුනිෆර් බෙරි |

(7) පහත ශීර්ෂයන් යටතට ගැනෙන උළුහාල් ඇට

| | | |
|---|---|---|
| 0910.99 | - - | අනෙකුත් |
| 0910.99.10 | ---- | උළුහාල් ඇට |

(8) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන තිරිඟු සහ මෙස්ලින්

| | | |
|---|---|---|
| 1001.10 | - | ඩුරම් තිරිඟු |
| 1001.90.10 | ---- | තිරිඟු බීජ |

(9) ශීර්ෂ 10.06 යටතට ගැනෙන, සහල්

(10) ශීර්ෂ 17.01 යටතට ගැනෙන, සීනි වර්ග

(11) උප ශීර්ෂ 1901.10.10 යටතට ගැනෙන බිළිඳුන්ගේ කිරි ආහාර

(12) උප ශීර්ෂ 2106.90.50 යටතට ගැනෙන බිළිඳුන් සඳහා වූ ආහාර

(13) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන සිමෙන්ති

| | | |
|---|---|---|
| 2523.21 | -- | කෘත්‍රිම ලෙස වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ සුදු සිමෙන්ති |
| 2523.29.30 | ---- | කි.ග්‍රෑම් 50 සහ ඊට වැඩි ඇසුරුම්වලින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති |
| 2523.30 | - | ඇලුමිනස් සිමෙන්ති (සිමෙන්ති පොන්ඩු) |
| 2523.90 | - | අනෙකුත් හයිඩ්‍රොලික් සිමෙන්ති |

(14) පහත ශීර්ෂයන් යටතට ගැනෙන ප්ලාස්ටික්වලින් නිමකළ අනෙකුත් තැටි, තහඩු, පටල, කොළ සහ තීරු

| | | |
|---|---|---|
| 3921.12 | -- | විනිල් ක්ලෝරයිඩවල බහු අවයවිකවල |
| 3921.13 | -- | පොලියුරිතීන්වල |

(15) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන රෝල් හෝ සීට් වශයෙන් ඇති, පත්‍ර කඩදාසි

| | | |
|---|---|---|
| 4802.54 | -- | බර වර්ග මීටරයට ග්‍රෑම් 40 ට අඩු |
| 4802.54.90 | ---- | අනෙකුත් |
| 4802.55 | -- | බර වර්ග මීටරයට ග්‍රෑම් 40 ක් හෝ ඊට වැඩි වන්නා වූ නමුත්, වර්ග මීටරයට ග්‍රෑම් 150 කට වැඩි නොවන්නා වූ, රෝල් වශයෙන් ඇති |
| 4802.55.90 | ---- | අනෙකුත් |
| 4802.56 | -- | නොනැමූ තත්ත්වයේදී එක් පැත්තක දිග මි.මී. 435 නොඉක්මවන්නා වූ සහ අනෙක් පැත්ත මි.මී. 297 නොඉක්මවන්නා වූ, බර වර්ග මීටරයට ග්‍රෑම් 40 ක් හෝ ඊට වැඩි වන්නා වූ නමුත් වර්ග මීටරයට ග්‍රෑම් 150 නොඉක්මවන්නා වූ |
| 4802.56.90 | ---- | අනෙකුත් |
| 4802.57 | - - | අනෙකුත්, බර වර්ග මීටරයට ග්‍රෑම් 40 ක් හෝ ඊට වැඩි වන්නා වූ නමුත්, වර්ග මීටරයට ග්‍රෑම් 150 නොඉක්ම වන්නා වූ |
| 4802.57.90 | ---- | අනෙකුත් |

(16) 50 සහ 63 ද ඇතුළුව, 50 සිට 63 දක්වා වූ පරිච්ඡේදයන්

(17) පහත ශීර්ෂයන් හා උප ශීර්ෂයන් යටතට ගැනෙන ත්‍රී රෝද රථ

| | | |
|---|---|---|
| 8703.21 | -- | සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටි මීටර 1,000 නොඉක්ම වූ |
| 8703.21.51 | ---- | අවුරුදු 3 1/2 කට වඩා නොපැරණි එල්.පී. ගෑස් මගින් ධාවනය කළ හැකි ත්‍රී රෝද රථ |
| 8703.21.52 | ---- | අවුරුදු 3 1/2 කට වඩා පැරණි එල්.පී. ගෑස් මගින් ධාවනය කළ හැකි ත්‍රී රෝද රථ |
| 8703.21.53 | ---- | අවුරුදු 3 1/2 කට වඩා නොපැරණි ත්‍රී රෝද රථ |
| 8703.21.54 | ---- | අවුරුදු 3 1/2 කට වඩා පැරණි ත්‍රී රෝද රථ |

01-570

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.